කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

*වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය*

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

**BMGT E 1015 – කළමනාකරණ මූලධර්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

(01) මෙහි පහත සඳහන් සිද්ධිය කියවා පහතින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**<u>වැවිලි කර්මාන්ත ආයතනයක් කළමනාකරණය කිරීම.</u>**

වැවිලි කර්මාන්තයට සබැඳි ආයතනයක කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් රාජකාරී භාරගත් චන්දන මසක කාලයක් ඉකුත්වීමෙන් පසුව බිම් මට්ටමෙහි තත්ත්වය පිළිබඳව දැනුවත්වීමේ අපේක්ෂාවෙන් එම ආයතනයේ වගා කලාප 5 කට අයත්වන අක්කර 13000 ක් ඉක්මවූ වගා කළ ඉඩම් ප්‍රමාණය එම වගා කලාප වෙත ගොස් අධීක්ෂණය කරන ලදී. වගා කලාප පහ කළමනාකරණය කරන ල්දදේ වගා අධිකාරීවරුන් පස් දෙනෙකු විසිනි. එම අධීක්ෂණ කටයුතුවලදී අනාවරණය වූ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා එම අධීක්ෂණය කරනු ලැබූ දිනට පසු දින රැස්වීමක් පවත්වන ලදී. එම රැස්වීමේ දී සාකච්ඡාවට භාජනය වූ කරුණු සම්පිණ්ඩනය කොට මෙහි පහත දක්වා ඇත.

කළමනාකරණ අධ්‍යක්ෂකරයා විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් කලාප අංක 5 හි වගා අධිකාරීවරයා ප්‍රකාශ කර සිටියේ තමා යටතේ පාලනය වන ඉඩම් ප්‍රමාණය පිළිබඳව සහ එම ඉඩම්වල ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර කාර්යයන් පිළිබඳ විස්තර වාර්තාගත කර තබාගෙන නොමැති බවය. මේ දක්වා ක්‍රියාත්මක කර ඇති ක්ෂේත්‍ර කාර්යයන්හි ප්‍රගතිය ඉදිරිපත් කිරීමට ද ඔහු අපොහොසත් විය. කෙසේ වුවද ඔහුගේ අදහස වූයේ එකී විස්තර තමාගේ අධීක්ෂණය යටතේ සේවය කරන ක්ෂේත්‍ර සහකාරවරුන් සතුව පවතින බවය. වගා කටයුතු තමාට අලුත් දෙයක් නොවන බවද, තමා මෙම ක්ෂේත්‍රයෙහි වසර විසිපහකට වැඩි කාලයක් කටයුතු කර ඇති බවද අංක 4 දරණ කලාපයේ වගා අධිකාරීවරයා ප්‍රකාශ කර සිටියේය. ඔහුට අනුව, වගා කරන ලද බීජ මත රඳා පවතින්නාවූ වගාවේ අස්වැන්න, මවිතයට පත්විය යුතු කරුණක් නොවන අතරම වගාවේ අවසාන නිමැවුම වගා වාරය අවසානයේදී නිශ්චිතවම දැනගන්නට ලැබෙන්නකි. ඔහු විසින් පැහැදිලි කළ පරිදි ඉලක්ක කලින් සකස් කිරීමට හේතුවක් නොමැත. නෙලන ලද උක් දඬු ප්‍රමාණය එනම් උක් දඬු ටොන් ප්‍රමාණයට අදාල දත්ත ලබාගැනීමේ අවශ්‍යතාවයක් මතු වන්නේ නම් එම දත්ත කර්මාන්තශාලාවේ පවත්වාගෙන යන වාර්තා මගින් ලබා ගැනීමට හැකිවන බවද ඔහු පැහැදිලි කළේය. තමා යටතේ පාලනය වන ක්ෂේත්‍ර කටයුතු ප්‍රගතිය පිළිබඳව කරුණු පැහැදිලි කළ අංක 3 දරණ වගා කලාපයේ වගා අධිකාරීවරයා සඳහන් කළේ එම විස්තර හරියාකාරවම දන්නේ කම්කරුවන් වන බවයි. ඔහු තවදුරටත් පැහැදිලි කළේ කාර්යයන් සත්‍යවශයෙන් ඉටු කරනු ලබන්නේ කම්කරුවන් විසින් වන බවයි. නෙලනු ලබන අස්වැන්න කලින් තීරණය කරන ලද්දක් නොවන බවද ඔහු පැහැදිලි

කළේය. මෙහිදී තවදුරටත් පැහැදිලි වූ කරුණක් වූයේ කාර්යාලයේ සේවය කරන්නා වූ කිසිවෙක් තමන් විශේෂයෙන් වගකිව යුත්තේ කුමන කාර්යන් සම්බන්ධයෙන් ද යන්න දැන නොසිටීමය.

සමස්ත වගා කටයුතු සියල්ල ප්‍රධාන වශයෙන් පැවරී ඇති වගා අධිකාරීවරුන්ගේ අධීක්ෂණ කටයුතු භාරව සිටින්නා වූ වගා කළමනාකාරවරයාද වඩා හොඳ අස්වැන්නක් ලබාගැනීමට විශේෂයෙන් බලපාන ක්ෂේත්‍ර කාර්යයන්හි කාර්යඵල පිළිබඳ ප්‍රගතිය පිළිබඳව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය කළ කළමනාකාර අධ්‍යක්ෂවරයා එකී ප්‍රගතිය සමාලෝචනය කර බැලීමට වගා කළමනාකාරවරයා විසින් යමක් නොකරන්නේ මන්ද යන ප්‍රශ්නය මතු කර සිටියේය. බිම පෝරු ගෑම, සීසෑම, පොහොර කිරීම සහ බීජ පැළ සිටුවීම වැනි සෑම ක්ෂේත්‍ර කාර්යයක්ම ස්වභාවයෙන්ම නැවත නැවත ඉටු කරන්නා වූ කාර්යයන් බව වගා කළමනාකාරවරයා සහ වගා අධිකාරීවරුන් පිළිගන්නා ලදී. කළමනාකාර අධ්‍යක්ෂවරයා විමසා සිටියේ යටත් පිරිසෙයින් එකී ක්ෂේත්‍ර කාර්යයහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා හෝ වැඩ පිළිවෙලක් සකසා නොමැත්තේ මන්ද යන්නයි.

වගා කලාප අංක 4 හි වගා අධිකාරීවරයා ප්‍රකාශ කර සිටියේ තමා විසින් දෙමුහුන් බීජ පැළ වර්ග කිහිපයක් සොයාගෙන ඇති නමුත් ඒවා ප්‍රයෝජනයට ගෙන වැඩි අස්වැන්නක් ලබාගැනීමට කිසිවකු උනන්දු නොවන බවයි. වැඩි දියුණු කරන ලද බීජ පැළ වර්ග කිහිපයක් ඇති බව අනෙකුත් වගා අධිකාරීවරුන් දැන සිටියේ නැත. සමහර වගා කලාපවලට පොහොර ලබාගැනීම අත්‍යාවශ්‍ය වී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිවක් කර තිබුනේ නැත. එසේ වුවද දැනට සති දෙකකට පෙර පොහොර තොගය ගබඩාව වෙත ලඟා වී තිබුනි. ක්ෂේත්‍ර කාර්යයන් සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද උසස් මට්ටමේ නවීන විද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳව බොහෝ වගා අධිකාරීවරුන් දැන සිටියේ නැත.

(අ) ඉහත සඳහන් ආයතනය තුළ ඇති ඔබ විසින් හඳුනාගත් කළමනාකරණ ගැටළු මොනවාද යන්න කළමනාකරණ මූලධර්ම සහ සංකල්ප යොදාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 14 යි)

(ආ) එසේ හඳුනාගත් කළමනාකරණ ගැටළු විසඳීම සඳහා ඔබ විසින් කරනු ලබන නිර්දේශ මොනවාද යන්න කළමනාකරණ මූලධර්මවලට සහ සංකල්පවලට අනුකූලව පැහැදිලි කරන්න.

(ලකුණු 14 යි)

(02) "කළමනාකරණය යනු සංවිධාන සම්පත් සැලසුම් කිරීම, සංවිධානයකරණය, මෙහෙයවීම සහ පාලනය මගින් සංවිධාන අරමුණු කාර්යක්ෂමව සහ සඵලදායී ලෙස සපුරාගැනීමයි"

- Richard L Daft. -

ඉහත සඳහන් කළමනාකරණය පිළිබඳ නිර්වචනයෙහි දැක්වෙන සමහර අංග විද්‍යාත්මක කළමනාකරණ න්‍යාය මගින් අවධාරණය කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 18 යි)

(03) මෙහි පහත සඳහන් ප්‍රශ්න අංක I සහ II යන ප්‍රශ්න දෙක අතුරින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(I) සංවිධානයක කටයුතු පිළිබඳව උනන්දුවක්/ සැලකිල්ලක් දක්වන්නන් සමඟ පවත්වන සම්බන්ධතා කළමනාකරණය කිරීම (managing stake holder relationship) පරිසරයට

අනුගතවීමේදී සංවිධානයකට වැදගත් වන්නේ මන්ද යන්නත් එවැනි සම්බන්ධතා කළමනාකරණය කිරීමේදී ගත යුතු පියවර කවරේද යන්නත් පැහැදිලි කරන්න.

(ලකුණු 18 යි)

**හෝ**

(II) සංවිධානයක් විසින් පරිසරයට සෘජු ලෙස බලපෑම් කිරීම යන්නෙන් අර්ථවත් වන්නේ කුමක්දැයි පැහැදිලි කර සංවිධානයක් විසින් එහි ගණුදෙනුකරුවන්ට, සැපයුම්කරුවන්ට, නියාමකයින්ට සහ වෘත්තීය සංගම්වලට බලපෑමක් කළ හැක්කේ කෙසේදැයි යටත් පිරිසෙයින් එක් අංගයකට එක් ප්‍රායෝගික උදාහරණයක් වන පරිදි උපුටා දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 18 යි)

(04) රැකියා නිර්මාණය කිරීම සඳහා යොදාගත හැකි (රැකියා) විශේෂීකරණය සහ රැකියා ගති ලක්ෂණ ප්‍රවේශය විස්තර කර එම ප්‍රවේශ දෙකෙහි ඇති වාසි අවාසි එකිනෙක සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 18 යි)

(05) "කළමනාකරණ තීරණයන් ගැනීම තාර්කිකවම කළ යුතුයැයි උපකල්පනය කරනු ලැබේ. එහෙත් කළමනාකරුවන් සැබෑ ලෝකයේ දී ගනු ලබන්නා වූ තීරණ තාර්කිකත්වයේ අවශ්‍යතා සම්පූර්ණ නොකරයි."

(අ) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියක උපකල්පන පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 09 යි)

(ආ) සීමා සහිත වූ තාර්කික තීරණ ගැනීම (Bounded Rationality) යන්නෙන් අර්ථවත් වන්නේ කුමක්ද යන්න පැහැදිලි කර සීමාසහිත වූ තාර්කික තීරණ ගැනීම, තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් වෙනස් වන්නේ කෙසේදැයි ප්‍රායෝගික උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 09 යි)

(06) නිමි ඇඳුම නිෂ්පාදනයෙහි නියැලී සිටින නෙත්සර කර්මාන්තායතනය නිමි ඇඳුම් මිලදී ගනු ලබන්නන්ගේ ඉල්ලීම් සපුරාලීම පිණිස එහි නිෂ්පාදන කටයුතු මෑතදී පුළුල් කරන ලදී. නිමි ඇඳුම් කල්වේලා ඇතිව ඇනවුම් කරන මිලදී ගන්නන් පිරිසක් මෙම ආයතනය සතුව සිටියහ. කෙසේ වුවද මෑතදී ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදනය පුළුල් කිරීමේ වැඩසටහනත් සමඟම ඇනවුම්වලට අනුකූලව නිමි ඇඳුම් සැපයීමේ අපහසුතාවයක් මෙම කර්මාන්තායතනයට ඇති විය. නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් ලබාගැනීමේත් ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමේත් කිසිඳු ප්‍රශ්නයක් නොතිබූ බව අනාවරණය විය. කෙසේ වුවද මෙම කාර්මාන්තායතනය පුළුල් කිරීම සම්බන්ධයෙන් උපදෙස් දෙන ලද කළමනාකරණ උපදේශකවරයා විසින් පැහැදිලි කරනු ලැබුයේ මිලදී ගන්නන්ගේ ඉල්ලීම සපුරාලීමට මෙම කර්මාන්තායතනය අසමත් වී ඇත්තේ කර්මාන්තායතනයේ නිෂ්පාදනය සඳහා පාලන ක්‍රියාවලියක් ස්ථාපිත කර නොමැති නිසා බවයි.

<u>ප්‍රශ්නය</u>

මෙම කර්මාන්තායතනයේ නිෂ්පාදනය සඳහා පාලන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා ඔබ කැඳවා ඇතැයි උපකල්පනය කොට පාලන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමේ දී ගතයුතු මූලික පියවර මොනවාදැයි විස්තර සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 18 යි)

(07) මෙහි පහත සඳහන් මාතෘකා අතුරින් මාතෘකා තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) සංකල්පනාත්මක දක්ෂතා සහ සඵලදායිතාවය අතර ඇති සම්බන්ධතාවය

(ආ) ගැටළුවක් ඇති බව පෙන්නුම් කරන ලක්ෂණ සහ ගැටළුවක් අතර වෙනස

(ඇ) කළමනාකරණ කාර්යයන් අතර ඇති අන්තර් සම්බන්ධතාවය

(ඈ) කළමනාකරුවකු නායකයකු වන්නේ කෙසේද යන්න.

(ලකුණු 18 යි)

(08) මෙහි පහත දැක්වෙන අංක I සහ II යන ප්‍රශ්න දෙක අතුරින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන, පිළිතුරු සපයන්න.

(I) (අ) අභිප්‍රේරණය පිළිබඳ සාධාරණත්ව න්‍යායෙහි (Equity Theory) දැක්වෙන සමාජ සාධාරණත්වය (Social equity) යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(ආ) සේවකයකු තමාගේ යෙදවුම් සහ ප්‍රතිඵල අනුපාතය අනෙක් අයෙකුගේ යෙදවුම් සහ ප්‍රතිඵල අනුපාතය සමඟ සංසන්දනය කිරීමේදී අසාධාරණ තත්ත්වයක් අත් දකින්නේ නම් ඔහු විසින් ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ඇ) කළමනාකරුවකු සාධාරණත්ව න්‍යාය යොදාගෙන සේවකයින් අභිප්‍රේරණය කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු විසින් මතක තබාගත යුතු වඩාත් වැදගත්ම වන අදහස කුමක්ද?

(ලකුණු 18 යි)

**හෝ**

(II) කළමනාකරුවකු විසින් මෙහි පහත දැක්වෙන එක් එක් අභිප්‍රේරණ න්‍යාය පදනම් කරගෙන අභිප්‍රේරණ ශිල්පීය ක්‍රම නිර්මාණය කරන්නේ නම් ඔහු විසින් එකී එක් එක් න්‍යාය යටතේ සැලකිල්ලට ගත යුතු අංගයන් මොනවාදැයි පැහැදිලි කරන්න.

(අ) මැෂ්ලෝගේ (Mashlow) අවශ්‍යතා ධූරාවලිය

(ආ) හර්ස්බර්ගේ (Herzberg) ද්විසාධක න්‍යාය

(ඇ) වික්ටර් රූම් (Victor Room) ගේ අපේක්ෂතා න්‍යාය (Expectancy Theory)

(ලකුණු 18 යි)